**අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2016**

**-----------------------------------------------------**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2)වගන්තිය සහ 2014 ඔක්තෝබර් 03 දිනැති අංක 1882/51 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ 17(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 49(1) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරිගණක යටතේ ප්‍රාග්ධනීත කල යුතු රු.421,500ක් වටිනා CCTV කැමරා පද්ධතිය සවි කිරීමේ වියදම් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනීත කර තිබීම හේතුවෙන් ගොඩනැගිලි එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද පරිගණක එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ ජනවාරි මාසයේ සිට පරිහරණය කරනු ලබන විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටි ගොඩනැගිල්ලේ වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබුණු රු. 730,000 ක් වටිනා Digital Oscilloscope උපකරණ 02ක් සඳහා වසර 05ක වගකීම් සහතිකයක් ඊට අදාල ලංසු ලේඛන අනුව සැපයිය යුතු වුවද මිලදී ගත් එම උපකරණ සඳහා වගකීම් සහතික ලබාගෙන නොතිබුණි.

## 2.3 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති,රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 5(ඉ) වගන්තිය සහ 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 16(2) (ඇ) සහ (ඉ) ඡේද | වාර්ෂික අයවැය ලේඛනය සමග ව්‍යාපාරික සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 (1) | ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් විධිමත් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 07/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ආයතනයේ සේවකයින්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කල යුතු වුවද විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ 34 දෙනෙකුගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතාකර නොතිබුණි. |
| (ඈ) 2009 දෙසැම්බර් 02 දිනැති රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ භාවිතය සඳහා වන ප්‍රතිපත්ති හා කාර්ය පරිපාටි සඳහා වන ඉ - රාජ්‍ය ප්‍රතිපත්ති අංක 010106 | රු.මිලියන 2කට වැඩි තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ උපදේශන සේවා ලබාගත යුතු වුවද 2016 තොරතුරු සන්නිවේදන තාක්ෂණය සඳහා රු.13,724,870 ක් වැය කර මිලට ගැනීම් සිදු කර තිබුණු නමුත් ඒ සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ උපදේශනය ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 453,080 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.148,756 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.601,836ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සේවක පාරිශ්‍රමික, සැපයුම්, සේවා හා ක්ෂය වියදම රු. 10,134,353 කින් වැඩිවී තිබුණද පුනරාවර්තන රාජ්‍ය ප්‍රදාන රු. 11,354,434 කින් වැඩි වී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය ගැලපීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ දායකත්වය පිළිවෙලින් රු. 38,650,689 ක් හා රු.27,643,516ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ දායකත්වයේ රු. 11,007,173 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

(අ) 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන පනත ප්‍රකාරව පාලක මණ්ඩලය සකස් කරන ලද නියමාවලියට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5,6 හා 7 මට්ටමේ පාඨමාලා සහ ඒ හා සමාන මට්ටම්වල වෙනත් තාක්ෂණවේදී පාඨමාලා මෙහෙයවීම විද්‍යායතනයේ අරමුණු ලෙස දක්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) පාඨමාලා ආරම්භ කර වර්ෂ 02 ක් ඉක්ම ගොස් තිබුණ නමුත් විද්‍යායතනය පවත්වන පාඨමාලා 08 සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් (NVQ) 5,6 හා 7 මට්ටමේ වෘත්තීය තත්ත්ව පාලන සහතිකය (accreditation) ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ එක් එක් පාඨමාලාවට අදාලව පැවැත්වෙන විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා සැලකිය යුතු කාල ප්‍රමාදයක් පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව 2015 වර්ෂයේ පැවති පදනම් විභාගය සහ 2015 පළමු සමාසික විභාගයේ ප්‍රතිඵල වසරකින් ප්‍රමාද වී තිබුණු අතර 2015 හා 2016 වසරේ පැවති අනෙකුත් විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රමාදය මාස 06 ක් ඉක්මවා තිබුණි.

(ආ) ආයතනය විසින් සකස් කර අනුමත කර තිබූ 2016- 2018 සංයුක්ත සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුල සපුරාගත යුතු පහත සඳහන් ක්‍රියාකාරකම් වලට ලඟාවී නොතිබුණි.

(i) සමාලෝචිත වර්ෂය තුල පවත්නා පාඨමාලා සංඛ්‍යාව 08 සිට 09 දක්වා වැඩිකර, බඳවා ගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව 270 දක්වා වර්ධනය කර ගත යුතු වුවද පවත්නා පාඨමාලා 08 ට අදාලව පමණක් ශිෂ්‍යයින් 258 ක් ලියාපදිංචිකර ගෙන තිබූ නමුත් එයින් ශිෂ්‍යයින් 54 දෙනෙකු පාඨමාලාව හැරගොස් තිබුණි. ඒ අනුව පාඨමාලා 8 හි අධ්‍යයන කටයුතු වල නියැලි ශිෂ්‍ය සංඛ්‍යාව 204 ක් දක්වා අඩුවී තිබුණි.

(ii) විද්‍යායතනයේ අධ්‍යයන පරිසරය වර්ධනය කිරීමට අදාලව වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (Career guidance unit)හා ශිෂ්‍ය උපදේශක ඒකකය (Student Counseling unit) ස්ථාපිත කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසාන වන තෙක් එම ඒකක පිහිටුවා නොතිබුණි.

**4.2. කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට විද්‍යායතනයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 27ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 15ක් වූ අතර ඒ අනුව පුරප්පාඩු 12ක් පැවති නමුත් ඒවා පිරවීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් අළුතින් ආරම්භ කිරීමට අපේක්ෂිත පාඨමාලා ආරම්භ කිරීමට නොහැකි වී ඇති අතර පවත්වාගෙන යන පාඨමාලාවල විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා සැලකිය යුතු කාල ප්‍රමාදයක් සිදුවන බවද නිරීක්ෂණය විය.

**4.3 හඳුනාගන්නා ලද පාඩු**

-------------------------

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතෙහි 37(අ) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින් සැපයිය යුතු වාර වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2015 වර්ෂය වෙනුවෙන් රු. 6,093ක අධිභාරයක්ද දායක මුදල් ගෙවීම් ප්‍රමාදවීම හේතුවෙන් රු.4,201 ක අධිභාරයක්ද විද්‍යායතනයේ අරමුදලින් ගෙවා තිබුණි.

**4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

-----------------------------------------

ලංසුකරු ඉදිරිපත් කළ පිරිවිතර හා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ අනුව ඉලෙක්ට්‍රොනික් පාඨමාලාව සඳහා සමාලෝචිත වර්ෂය තුලදී මිලදීගෙන තිබූ රු. 1,500,000 ක් වටිනා විද්‍යාගාර උපකරණ 06 (Oscilloscope Analogue) තායිවානයේ නිෂ්පාදිත උපකරණ විය යුතු වුවත් භෞතිකව පරික්ෂා කිරීමේදී එම උපකරණ චීනයේ නිෂ්පාදිත උපකරණ බව නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

------------------------------------------

**5.1 විගණන කමිටු**

------------------

2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඩී 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව විද්‍යායතනය විසින් විගණන කමිටු පිහිටුවා නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකල යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ඉන්වෙන්ට්‍රි පාලනය | එක් එක් අංශ සඳහා යාවත්කාලීන ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබීම. |
| (ආ) වත්කම් කළමනාකරණය | වත්කම් ගිණුම් තැබීම හා ලේඛන පවත්වා නොගැනීම. |
| (ඇ) වාහන පාලනය | ආයතනය සතු සංචිත වාහන වල අදාල ධාවන විස්තර ඇතුළත් ධාවන සටහන් නිසි පරිදි නඩත්තු නොකිරීම. |